**වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 - 2024**

**------------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන,මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 09 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය මතය සඳහා හේතු වී ඇති ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක රු.4,654,758 ක් වූ පෙර වර්ෂයේ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙවැනි ගිණුම්කරන අඩුපාඩු නොවීමට අවශ්‍ය කටයුතු කර ඇත. | උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක රු.598,562 ක්වූ සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුම්ගත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. | උපචිත පදනම මත සමාලෝචිත වර්ෂයට අදාල සියලු ආදායම ගිණුම්ගත කළ යුතු අතර නිසි පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර වරද නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 08 ක ජංගම වත්කම්වල වටිනාකම රු.1,156,789 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ වටිනාකම සමුච්චිත අරමුදල ගැලපීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර අදාළ ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක රු.4,115,706 කි වටිනා ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ ගිණුම්ගත කර නොතිබුණ හෙයින් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම්වල වටිනාකම ගිණුම්ගත කර සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 02 ක රු.299,246 ක්වූ ජංගම වගකීම් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | වගකීම්වලට අදාල ලියවිලි ලබා ගෙන කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | වගකීම් නිවැරදිව ගිණුම්ගත කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 09 ක ඉකුත් මුදල් වර්ෂයට අදාළව ප්‍රතිපූර්ණය කර තිබූ රු.2,766,784 ක බෙදාදීමේ වියදම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් වශයෙන් දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය පොහොර සංස්ථාවේ සහනාධාර මුදලට පොහොර විකිණීමට අදාලව හැසිරවීමේ පිරිවැය දිස්ත්‍රික් කාර්යාල මගින් ආදායමක් වශයෙන් ලැබෙන බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. | ප්‍රතිපූරණය වන වියදම් ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ අයකර තිබූ, 2023 වර්ෂයට අදාල හිඟ අක්කර බදු රු.31,588 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ අදායමක් ලෙස දක්වා තිබීමෙන් ආදායම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ වටිනාකම ඉදිරියේදි සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | උපචිත පදනම මත ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත්කළ යුතු අතර ඒ සඳහා විධිමත් පාලන ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 02 ක ගොඩනැගිලි ක්ෂය ගණනය කිරීමේදි වත්කම්වල පිරිවැය වෙනුවට හීනවන ශේෂය මත ක්ෂය කිරීමෙන් ක්ෂය රු. 234,715 ක් අඩුවෙන් ගණනය කර තිබුණු අතර එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණය ක්ෂය කිරීම් ගණනය කිරීම් ඉදිරියේදි නිසි පරිදි සිදු කරන බව දැනුම් දෙමි. | නිවැරදි මූල්‍ය ප්‍රතිපත්ති මත අදාළ ක්ෂය කිරීම් සිදු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ගොවිජන සේවා කාරක සභා 03 ක රු.41,197 ක ස්ථාවර තැන්පත් පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා නොතිබීමෙන් අතිරික්තයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි අදාල පරිදි පොලී ආදායම ගණනය කර ගිණුම් ප්‍රකාශවල දැක්වීමට කටයුතු කරමි. | උපචිත පදනම මත කාල පරිච්ජේදයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කෝවිල්කුලම ගොවිජන සේවා කාරක සභාවේ කුලී ආදායම් වර්ග 03 කට අයත් රු 446,670 ක කුලී ඇදායම් සමාලෝචිත වර්ෂයේ ඇදායම් ලෙස ගිණුම්ගතකර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | ට්‍රැක්ටර් යන්ත්‍රය සඳහා රක්ෂණ ආවරණය සහ ආදායම් බලපත්‍ර ලබා දීමට කටයුතු නොකිරීම නිසා කුලී අයකිරීමට නොහැකිව ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයට ඒමට ඇති බැවින්, මෙම මුදල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු නොකෙළෙමි. | උපචිත පදනම මත කුලී ආදායම් ගිණුම්ගත කර නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 1.3.2 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක 08 ක සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ශේෂයන් ලෙස රු. 10,119,075 ක් හා කාරක සභා 05 ක ගෙවිය යුතු ශේෂයන් ලෙස රු.4,450,717ක් දක්වා තිබුණද, එම ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ගිණුම් සනාථ කිරීමට අවශ්‍ය ලේඛන විනාශ වී ඇති බැවින්, මෙම ශේෂය කපා හැරීමට අනුමැතිය ලබා දෙන මෙන් ගොවිජන සේවා සංවර්ධන සහකාර කොමසාරිස් වෙත දැනුම් දෙන ලදී. | ගිණුම් වල දක්වා ඇති ශේෂයන් සනාථ කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට හෝ විධිමත් විමර්ශනයකින් පසු ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති රු.267,345 ක වටිනා වත්කම් භෞතිකව විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබා ගෙන ඒ අනුව සහකාර කොමසාරිස්ගේ අනුමැතියක් සහිතව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්වල දක්වා ඇති වත්කම් භෞතිකව සත්‍යාපනය සඳහා විගණනයට ඉදිරිපත් කළයුතු අතර එම වත්කම් නොමැතිනම් අවශ්‍ය විමර්ශනයන් කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | පම්පෙයිමඩු ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබු රු.8,754,026 ක් වටිනා ස්ථාවර තැන්පත් 02 කට අදාලව ස්ථාවර තැම්පත් සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | බැංකුවට දැනුම්දී අළුතෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පත් සහතික විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (අ) 25(1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 09 ක අධීක්ෂණ කමිටු පත්කර නොතිබුණි. | ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් සංවර්ධන සහා අධීක්ෂණ කමිටු පත්කර නොතිබුණි. | පනතේ අදාළ වගන්තිය අනුව කටයුතු කර අධීක්ෂණ කමිටු පත් කළ යුතුය. |
| (ආ) 44 (1) වගන්තිය | පනත අනුව, ගොවිජන සේවා කාරක සභා 09 ක වාර්ෂික ගිණුම් අභ්‍යන්තර පරීක්ෂාවකට ලක් කර නොතිබුණි. | ඉදිරියේදි ගිණුම් පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ අදාළ වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 09 ක එකතුව රු.11,481,157 ක ශුද්ධ අතිරික්තය වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,260,796 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,220,361 ක් වර්ධනයක් නිරීක්ෂණය විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් වැව් මායිම් ලකුණු කිරීම සඳහා මිලදී ගන්නා ලද රු.1,459,160 ක් වටිනා මායිම් ගල් 2029 ක් අදාල අරමුණ සඳහා යොදවා ගැනීමෙන් තොරව, අදාල මධ්‍යස්ථානවල රඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණ විය. | ඉදිරියේදී මෙතෙක් මායිම් නොකළ වැව් වල මිණුම් කටයුතු නිම කර මායිම් ගල් හිටවීමට කටයුතු කරනු ලැබේ. | මායිම් ගල් අදාළ කාර්යය සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මඩුකන්ද ගොවිජන සේවා කාරක සභාවේ 2014 / 2015 වර්ෂවලට අදාළ රු.61,600 ක් පොහොර සහනාධාර වැඩිපුර ගෙවීම් 2018 වර්ෂයේදි අයකර තිබුණද, වර්ෂ 06 කට වැඩි කාලයක් එම මුදල අදාළ ආයතනයට යැවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි අදාළ මුදල එම ආයතනය වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | අය කරන ලද මුදල් අදාළ ආයතනය වෙත යැවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සෙට්ටිකුලම ගොවිජන සේවා කාරක සභාවට අයත් ගොවිජන භෝජන ශාලාව 2023 ඔක්තොබර් මාසය සිට වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා අදාළ පාර්ශවය සමඟ නිසි පරිදි ගිවිසුම් ගතවී නොතිබුණි. | 2025 වර්ෂයේ භෝජන ශාලාව පවත්වා ගෙන යාමට අවශ්‍ය ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ | අදාළ පාර්ශව සමග විධිමත් පරිදි ලිඛිතව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 02 ක රු.719,791 ක් වටිනා කල් ඉකුත්වූ තොග සම්බන්ධයෙන් වර්ෂ 10 සිට 16 දක්වා කාලයතුල අවශ්‍ය කටයුතු සිදුනොකර එම තොග ගබඩාවේ රඳවා තිබුණි. | ඉහත තොග සම්බන්ධයෙන් කමිටුවක් පත්කර පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | විධිමත් අනුමැතියක් යටතේ කල් ඉකුත්වූ තොග සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02 ක 2021 වර්ෂයේ රු. 355,710 ක් වැය කර නිෂ්පාදන කරන ලද කාබනික පොහොර තොගය ප්‍රතිලාභීන් වෙත නිකුත් නොකර නිෂ්කාර්යව තිබුණි. | මේ සම්බන්ධයෙන් සහකාර කොමසාරිස්ගේ අනුමැතිය අනුව අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | කාබනික පොහොර තොගය ඵලදායී ලෙස යොදාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | මඩුකන්ද ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවීන් වෙත හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා 2016 වර්ෂයේ ගොවීන්ගෙන් අයකර තිබූ, රු. 285,000 ක මුදල වර්ෂ 08 කට වැඩි කාලයක් අදාල අරමුණ සඳහා යොදවා නොගෙන රඳවා ගෙන තිබුණි. | අවශ්‍ය තොරතුරු නොමැති බැවින්, සහකාර කොමසාරිස්ගේ උපදෙස් අනුව කටයුතු කටයුතු කරනු ලැබේ. | වසර 5ක් පමණ මෙම පොහොර උපයෝජනය නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, ගුණාත්මකභාවය පරීක්ෂාකර මෙම පොහොර නිකුත් කිරීමත් කළ යුතුය. |

## 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝවිල්කුලම ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල මධ්‍යස්ථානයේ බීජ වී සහ පැල තොග අඩුවීම නිසා රු. 2,131,815 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මධ්‍යස්ථානයට පාඩුවන රු.2,131,815ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර අතර, සහකාර කොමසාරිස් දැනුවත් කර ඇත. | විධිමත් පරිදි විමර්ශන කටයුතු සිදුකර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර අදාල පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 ක ට්‍රක්ටර් රථ 61 ක්,ට්‍රැක්ටර් ටේලර් 15 ක් සහ වත්කම් වර්ග 06 ක අයිතම් 45 ක් වර්ෂ 08 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් කාරක සභාවකට පැවරීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.172,752,795 ක් වටිනා කිලෝ ග්‍රෑම් 805,117ක බීජ වී සහ කිලෝ ග්‍රෑම් 10,450 රසායනික පොහොර සඳහා ප්‍රසම්පාදන පටිපාටින් අනුගමනකර නොතිබුණි. | ඉදිරියේදී මිලදී ගැනීම්වල අදාළ පරිපාටින් අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු මිළදී ගැනීම් වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අදාල ක්‍රියාපටිපාටින් අනුගමනය කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක 2024 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 52 දෙනෙකු ගෙන් ලැබිය යුතු රු.8,875,545 ක මුදල, වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය ශේෂ කාලිනව අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත් ඒවා කඩිනමින් අයකර ගැනීමත් සිදු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 07 ක 2024 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් 28 දෙනෙකුට ගෙවිය යුතු රු.7,805,739 ක මුදල වර්ෂ 02 සිට වර්ෂ 14 දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල අදාල හිඟ මුදල සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | විධිමත් පරිදි කටයුතු කර ණය ශේෂ සනාථ කරවා ගෙන අදාළ මුදල් කඩිනමින් ගෙවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10ට වඩා වැඩි කාලයක සිට මුදල් රෙගුලාසි 133 හා 134 අනුව, ගොවිජන සේවා කාරක සභා 09 ක ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ක්‍රියාකාරකම් සඳහා මුදල් රෙගුලාසි අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 5 ගොවිජන බැංකු කටයුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 04/2012 දරණ ගොවිජන බැංකු චක්‍රලේඛ අනුව, ගොවිජන කාරක සභා 08 කින් ලබා දී තිබූ ණය මාස 06 ක් ඇතුලත අයකර ගතයුතුවූවත් ප්‍රතිලාභීන් 141 දෙනෙකුගෙන් අයකර ගතයුතු රු.5,184,919 ක් වටිනා හිඟ ණය මුදල වර්ෂ 02ත් 12ත් අතර කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදලින් රු.511,502 අයකර ගෙන ඇත. තවද, රු.4,673,417 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | හිඟ ණය කාලීනව අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය. |